විශ්වජිත් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව




නර්ස් නෝනගෙ රස්සාව ලෙඩ්ඩු බලා ගන්න එකද නැත්නම් පාර දිහා බලා ඉන්න එකද?" ඔහු ඇසුවේය. ඒ හඬෙහි තරහක් තිබුණේ නැත.

"සොරි සර්.. මම.. හිතුවෙ... සර් නිදි.. කියලා.. ස්නේහා ගොත ගැසුවාය.
"අවදියෙන් ඉන්න ලෙඩ්ඩුන්ට පමණක් සාත්තු කළ යුතුයි කියලද ෆ්ලොරන්ස් නයිටින්ගේල් නෝනා කියලා තියෙන්නෙ?" ඔහු අසන්නේ ඇය අමාරුවේ දමන්නට වගේය.
"අනේ සොරි සර්.. මම.. මල් එක හදන ගමන්.. නිකමට වගේ පාක් එක දිහා බැලුණා.. සර්ට මොනා හරි ඕනෙද? බොන්න දෙයක්?" ස්නේහා ගොත ගැසුවාය. පිට පුරා හීන් දාඩියක්ද ගලා යනු දැනෙයි. පපුවත් ගැහෙනවා ඇයටම දැනෙයි.
"බොන්න මොනා හරි තිබුණ නම් හොඳයි.. ඒත් හොස්පිට්ල් එකේ තියෙනවද මන්දා?"
"මොනාද..?"
"බොන ජාති.. "
"තියෙනවා.. ඔරෙන්ජ් ජූස්.. ලෙමනේඩ්.. බාර්ලි. තේ.. කෝපි.."
"ඒ මොනවද ළමයො.. ඒ පොඩි ළමයි බොන ජාතිනෙ.. අපි බොන්නෙ ඕව නෙවෙයි.."
"ලෙඩ වුණාම බොන්න දෙන්නෙ ඒව තමයි.."
"කවුද ලෙඩ වෙලා ඉන්නෙ..? "
"ඇයි සර් ලෙඩ වෙලා නෙවෙයිද?"
"ලෙඩ වෙලා නෙවෙයි... ලෙඩක් දාගෙන.." ඒ හතර බීරි කතාව කීවේද අර ලස්සන සිනාව දාගෙනමය. කියන දෙයක් තේරෙන්නට නොකියන එකත් මහ වදයකි.

"මට තේරෙන්නෑ සර් මොනා කියනවද කියලා.. දැන් ඩොක්ටර් ආවම දැනගන්න පුලුවන්නෙ ලෙඩක් තියෙනවද නැද්ද කියල .."
"ඇයි ස්නේහට කියන්න බැරිද මට ලෙඩක් තියෙනවද නැද්ද කියලා.. "
ස්නේහා තිගැස්සුණේ ඒ කතාවට. එයා මගේ නම දන්නෙ කොහොමද? ඈ සිතුවාය.

"මොකද බය වෙලා වගේ.. ස්නේහා දන්නවද..? මට දිවැස් තියෙනවා.. ඕන කෙනෙක්ගෙ මූණ බලලා නම කියන්නත් පුලුවන්.. " ලෙඩා නැගිට ඇඳ මත එරමිණියා ගොතාගෙන වාඩි වුණේය.
"විහිලු කරන්න එපා සර්.. කොහොමද මගේ නම දැන ගත්තෙ ..?"
"ඉවෙන්.. දිවැසින්.. ස්නේහගෙ ගම නුවර පැත්තෙ නේද?"
ඒ වතාවේ නම් ස්නේහා හොඳ හැටිම තිගැස්සුණාය. මූණත් රතුවුණේය.

"ඔය හැටි කලබල වෙන්න එපා ස්නේහා.. අයියෝ මං වගේ මිනිහෙක්.. මම තාම මාව අඳුන්නලා දුන්නෙත් නෑනෙ... මම අකලංක අමරසේකර.. "



ලෙඩ්ඩු නෙවෙයි වගේ පේනුණට
ඔය වගේ ඉන්න හැම මිනිහෙක්ම
ලෙඩෙක් තමයි ස්නේහා

## ස්නේහාගේත් අකලංකගේත් කතාව ළබන මාසයේ සිට සන්නසේ




LTS
LA TROBE TAXATION SERVICES
Your friendly tax accountants




La Trobe Taxation Services is in operation since 2001 and provide taxation services to businesses and individuals. Our areas of specialisation are individual tax returns, business tax returns, investment properties, GST, BAS, IAS, PAYG and registering of ABR. Whenever you have tax related issues we are here to assist you as possible as we could. Our fees are very reasonable and competitive.

La Trobe Taxation Services
Registered Tax Agent
(ABN 67 251 931 300)

CONTACT
Bundoora:
Mala: - 0401000421 or 03-94708241
Cranbourne:
Janaka:- 0403728635 or 03-87868033

Email: latrobetax@yahoo.com.au

www.latrobetax.com.au